**ශීර්ෂය 199 - ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 199 - ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජනවාරි 11 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම.

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2 ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 41.41 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 32.13 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 9.28 ක් හෙවත් සියයට 22.41 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 28.36 | 20.87 | 7.49 | 26.41 |
| මූලධන | 13.05 | 11.26 | 1.79 | 13.72 |
| **එකතුව** | **41.41** | **32.13** | **9.28** | **22.41** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 19901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ. (භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව)

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 3,500,000 | 0.00 | 20,000 | 21,787 | 35,000,000 | 1,114,800 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0451/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 2.47 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වූ අංන 6000/0000/00/0018/0024/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.340,000 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ.**

**3.1 ගිණුම් ඉදිරිපත් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයට අදාළ ශීර්ෂ 199 ට අදාළ විසර්ජන ගිණුම 2016 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එය මාස 09 ක ප්‍රමාදයකින් පසුව 2016 නොවැම්බර් 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ii) ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයට අදාළ විෂය අංක 19901 යටතේ වන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ

සැසඳුම් ප්‍රකාශය 2016 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එය 2016 නොවැම්බර් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

-----------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|---|
| (i) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | විසර්ජන (සම්මත) වැය ලෙජරය | මුදල් රෙගුලාසි 447 |
| (iii) | වාහන ලැයිස්තුගත ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඊ) |
| (iv) | හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

3.3 **විසර්ජන ගිණුම.**

-----------------

**අයවැය විචලනය.**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 8 ක් සඳහා සලසා තිබුණු රු.1,245,000 ක ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂයේදී කිසිදු උපයෝජනයක් නොකිරීම නිසා එම ප්‍රතිපාදන මුළුමණින්ම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 19 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ක සිට සියයට 29 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

3.4 **අනුකූල නොවීම්**

----------------

2006 පෙබරවාරි 21 දිනැති අංක CSA/2/3/4 දරන ජනාධිපති ලේකම් කාර්යාලය චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය දූත මණ්ඩල හෝ විදේශීය රාජ්‍යයන්හි අමාත්‍යාංශ සමඟ සෘජු සබඳතා පවත්වමින් නිල හෝ නිල නොවන චාරිකා යොදා නොගත යුතු බවත්, පෞද්ගලික මට්ටමින් ලැබෙන ආරාධනා සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර අනුමැතිය ලබා ගත යුතුව තිබුණත්, අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් පෞද්ගලික මට්ටමින් අන්තර්ජාලය හරහා සහ දූත මණ්ඩල මාර්ගයෙන් ලබාගත් විදේශ සංචාර සඳහා අවස්ථා 03 කදී අමාත්‍යවරයා, අමාත්‍ය කාර්ය මණ්ඩලය සහ අමාත්‍යාංශයේ නිලධාරීන් විදේශ ගතව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.2,271,961 ක් වැයකර තිබුණි

**3.5 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය.**

**අභ්‍යන්තර විගණනය.**

අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකයෙකු පත්කර නොතිබුණු අතර අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර තිබුණ ද ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර විගණනයන් සිදු කර නොතිබුණි.

**3.6 පාඩු හා හානි**

අමාත්‍යාංශය සතු කැබ් රථයක් 2015 නොවැම්බර් 21 වන දින මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මල් පෝච්චියක ගැටී සිදුවූ අනතුරෙන් රු.1,271,090 ක් අලාභයක් සිදුවී තිබුණි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට නිවැරදි තොරතුරු හෙළි නොකිරීම හේතුවෙන් රක්ෂණ වන්දි ලබා ගැනීමට නොහැකි වී තිබුණි. එහෙත් රථය පැදවූ රියදුරු සඳහා විනය පරීක්ෂණ 2016 දෙසැම්බර් 30 දින වන විටත් පවත්වා නොතිබුණි. මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාර ඉහත අලාභය සම්බන්ධව ඉදිරිපත් කළ යුතු ප්‍රාරම්භක වාර්තාව නිසි ලෙස සම්පූර්ණ කර එහි පිටපතක් විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කර නොතිබුණු අතර සිදුවූ අනතුර සම්බන්ධව පාඩු හා හානි ලේඛනයක සටහන් කර නොතිබුණි.

**3.7 කළමනාකරණ දුර්වලතා**

සීමිත මිල ගණන් කැඳවීමේ පරිපාටිය තෝරාගත යුත්තේ මූලාශ්‍ර කිහිපයක් පමණක් තිබෙන අවස්ථා වලදී පමණක් බව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා තිබුණත්, අමාත්‍යාංශය සඳහා රු.1,872,601 ක් සැපයුම් හා සේවා ලබාගැනීමේදී ලංසුකරුවන් 04 දෙනෙකුගෙන් පමණක් ලංසු කැඳවා තිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය.**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 08 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 22 | 21 | 01 |
| (iii) | ද්විතීයික මට්ටම | 39 | 23 | 16 |
| | **එකතුව** | **76** | **52** | **24** |